මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2017

# Primary Piriven Mid Year Term Test - 2017

3 වසර / Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**සංස්කෘත**
**Sanskrit**

කාලය : පැය තුනයි
Time : Three hours

01, 02, 04, ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. කෙටි පිළිතුරු සපයන්න.

I. සන්ධ්‍යක්ෂර ලියා දක්වන්න.

II. මහාප්‍රාණාක්ෂර කීය ද? ඒවා ලියා දක්වන්න.

III. දීර්ඝ අකුරක් ශබ්ද කිරීමේ දී මාත්‍රා කීයක් ගතවේ ද?

IV. අනුනාසිකාක්ෂර හඳුන්වන තවත් නමක් ලියා දක්වන්න.

V. අතීත කාලය හැඟවීමට යෙදෙන ලකාරයක් නම් කරන්න.

VI. අන්තඃස්ථාක්ෂර අයත් වන්නේ අඝෝෂවලට ද? ඝෝෂවලට ද?

VII. හිතෝපදේශයෙන් සමාජයට ගතහැකි ආදර්ශ තුනක් ලියා දක්වන්න.

VIII. " ज्येष्ठ मासः " යන සංස්කෘත වචනයෙන් අදහස් වන්නේ කුමන පොහොය ද?

IX. " तौ, यूयम्, वयम् " යන පද යොදා අර්ථ පූර්ණ කෙටි වාක්‍ය තුනක් නිර්මාණය කරන්න.

X. " यस्य नास्ति स्वयं प्रज्ञा । " යන්නෙන් ආරම්භ වන ශ්ලෝකය සම්පූර්ණ කොට ලියා දක්වන්න.

(ලකුණු 3 x 10 = 30 යි)

02. පහත සඳහන් උද්ධෘතය **සිංහලට** නගන්න.

अव्यापारेषु व्यापारं यो नरः कर्तुमिच्छति ।
स भूमौ निहतः शेते कीलोत्पाटीव वानरः ॥

अस्ति मगधदेशे धर्मारण्यसन्निहितवसुधायां शुभदत्तनाम्ना कायस्तेन विहारः कर्तुमारब्धः। तत्र करपत्रदार्यमाणैकस्तम्भस्य कियद्दूरस्फाटितस्य काष्ठखण्डद्वयमध्ये कीलकः सूत्रधारेण निहितः। तत्र बलवान् वानरयूथः क्रीडन्नागतः। एको वानरः कालप्रेरित इव तं कीलकं हस्ताभ्यां धृत्वोपविष्टः। तत्र तस्य मुष्कद्वयं लम्बमानं काष्ठखण्डद्वयाभ्यन्तरे प्रविष्टम्। अनन्तरं स च सहजचपलतया महता प्रयत्नेन तं कीलकमाकृष्टवान्। आकृष्टे च कीलके चूर्णिताण्डद्वयः पञ्चत्वं गतः।

- हितोपदेशे

(ලකුණු 20 යි)

**03.** පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

१. भटाः देशं रक्षन्तु।

२. वयं धर्मं वदिष्यामः।

३. गुरवः शिष्यान् अरक्षन्।

४. अहं तापसारामे अवर्धयम्।

५. एकस्मिन् हस्ते पञ्चाङ्गुल्यः सन्ति।

(ලකුණු 3 x 5 = 15 යි)

**04.** පහත සඳහන් වාක්‍ය **සංස්කෘතයට නගා දේවනාගරී** අකුරින් ලියන්න.

1. ඔබ අකුරු ලියහි.
2. මම මේ අතින් ලියමි.
3. ඒ උපාසිකාව බුදුන් වඳීවා.
4. ළමයි දෙදෙනා සෙල්ලම් කරත්.
5. ආදිවාසීහු කැලෑවෙහි වාසය කරති.

(ලකුණු 4 x 5 = 20 යි)

**05.** I. **अस्मद्** ( අස්මද් ) ශබ්දය **සියලු විභක්තීන්හි** වරනගන්න.

II. √**वस्** ධාතුව **लोट्** ලකාර **පරස්මෛපදයෙහි** ( **वसतु** ) වරනගන්න.

(ලකුණු 7½ x 2 = 15 යි)

**06.** I. ස්වර අක්ෂර මාලාව **හ්‍රස්ව, දීර්ඝ, සන්ධ්‍යක්ෂර, නාමින්,** අනාමින් යන කොටස්වලට බෙදා දක්වන්න.

(ලකුණු 10 යි)

II. පහත සඳහන් ඡේදයෙන් සර්වනාම පද **පහක්** තෝරා ලියන්න.

बालः गायति। स मधुरं गायति। श्रामणेरौ पठतः। तौ परीक्षणात् उत्तीर्यतः। शिष्याः शालायाम् उपविशन्ति। ते पाठान् पठन्ति। अत्र बालिका तिष्ठति। सा नन्दस्य स्वसा। त्वं कुत्र वससि? स स्वगृहे वसति। इदं आम्रफलम्।

(ලකුණු 1 x 5 = 05 යි)

07. පහත සඳහන් සංස්කෘත ශ්ලෝක සම්පූර්ණ කරන්න.

1. ඖදුම්බර භවං පුෂ්පං ....................................
2. බදරී කෝටි මූල්‍යාන්තු ....................................
3. නිරුත්සාහං නිරානන්දං ....................................
4. ස ජාතෝ යේන ජාතේන ....................................
5. ආයුර් විත්තං ගෘහේච්ඡිද්‍රං ....................................

(ලකුණු 3 x 5 = 15 යි)

08. හිතෝපදේශයෙහි ජීවිත සාර්ථකත්වයට පිටුවහලක් වන උපදෙස් පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 15 යි)

* * *